සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - වසන්ත ඇල්ලවල - සන්නිවේදන
Communication & Media Studies - wasantha Ellawala - Comm
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - වසන්ත ඇල්ලවල - සන්නිවේදන

**වසන්ත ඇල්ලවල**
WASANTHA ELLAWALA

ය හා මාධ්‍ය අධ්‍යයනය - වසන්ත ඇල්ලවල- සන්නිවේදනය හා
Communication & Media Studies - wasantha Ellawala -
ය හා මාධ්‍ය අධ්‍යයනය - වසන්ත ඇල්ලවල- සන්නිවේදනය හා

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
# General Certificate of Education (Adv. Level) Examination

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
Communication & Media Studies I

**29 S I**

**පැය දෙකයි**
*Two hours*

* **උපදෙස් :** 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන උත්තරවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** හෝ උත්තරය තෝරා ගෙන මෙම ප්‍රශ්න පත්‍රයේ ම _ යොදා දක්වන්න.

1. මෙරට ජනමාධ්‍ය සංස්කෘතිය ගොඩනැගීමට අවශ්‍ය ශක්තිමත් අඩිතාලම සකස් වූයේ
(1) පෘතුගීසි පාලන සමයේදී ය.
(2) පූර්ව යටත් විජිත පාලන සමයේදී ය.
(3) ලන්දේසි පාලන සමයේදී ය.
(4) පශ්චාත් යටත් විජිත පාලන සමයේදී ය.
(5) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ය.

2. කිසියම් රාජ්‍ය සංවිධානයකට ස්වකීය අභ්‍යන්තර මහජන සම්බන්ධතාවය පවත්වාගෙන යාමට වැදගත් කරුණක් නොවන්නේ
(1) අභ්‍යන්තර සේවක තෘප්තිමත් බව ගැන සැලකිලිමත් වීමයි.
(2) සේවකයින්ගේ නිර්මාණ ප්‍රදර්ශනයට අවස්ථාවක් සැලසීමයි.
(3) වාර්ෂිකව විනෝද චාරිකාවක් සඳහා රැගෙන යාමයි.
(4) තම තරඟකාරී ආයතනවල ප්‍රචාරණ කටයුතු සොයා බැලීමයි.
(5) කාර්යාල පරිශ්‍රය අලංකාරවත් ලෙස සකස් කිරීමයි.

3. ජනසන්නිවේදනය පිළිබඳ වඩාත් සුදුසු කරුණක් වන්නේ
(1) සංහතික ජනයා අතරට තොරතුරු රැගෙන යන්නක් බවයි.
(2) දොරටුපාලකයින් මඟින් සංදේශය නියාමනය වන බවයි.
(3) මුද්‍රිත මාධ්‍ය පමණක් ප්‍රමුඛ මාධ්‍යයක් ලෙස සැලකෙන බවයි.
(4) සමූහ සන්නිවේදනයට වඩා ප්‍රබල ක්‍රමෝපායක් බවයි.
(5) කිසියම් ප්‍රදේශයක් ඉලක්ක කරගෙන භාවිත වන බවයි.

4.තොරතුරු සම්පාදන කාර්යය පිළිබඳ වඩාත් සාවද්‍ය ප්‍රකාශය වන්නේ
(1) සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය ක්‍රියාකාරීත්වයක් වන බවයි.
(2) ශරීරයට ආහාර මෙන් මනසට තොරතුරු වැදගත් වන බවයි.
(3) විශ්වසනීයත්වය හා සත්‍ය ප්‍රමුඛ කරගත යුතු බවයි.
(4) තොරතුරු නිවැරදි වීමට වඩා කඩිනම් වීම අත්‍යවශ්‍ය බවයි.
(5) නව මාධ්‍ය මඟින් වේගයෙන් තොරතුරු සංසරණයවන බවයි.

5.ගෝලීයකරණයේ ස්වභාවය අනුව එහි අහිතකර බලපෑමක් වන්නේ
(1) කලාපීයකරණය වේගවත් වීමයි.
(2) විද්‍යාව හා තාක්ෂණය වේගයෙන් සංවර්ධනය වීමයි.
(3) ජනසන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයයි.
(4) ගෝලීය තොරතුරු අවකාශයක් නිර්මාණය වීමයි.
(5) ජාතික රාජ්‍යයන් දියවී යාමයි.

6.විකල්ප මාධ්‍ය පිළිබඳ සිසුන් අතර සිදු වූ සංවාදයකදී ගුරුවරයා මැදිහත්ව ඇතැම් කරුණු නිවැරදි කළේය. එහෙත් ගුරුවරයාට මගහැරී ගිය කරුණක් දැකිය හැකි වේ. එය
(1) හුදු ලාභ ප්‍රයෝජනවලින් තොරව භාවිත කෙරේ.
(2) සීමිත පහසුකම් මත පවත්වාගෙන යයි.
(3) එතරම් පුළුල් නොවූ බෙදාහැරීමේ ජාලයකින් යුතුවෙයි.
(4) සමාජය පවත්වාගෙන යාමේ පරමාර්ථයක් සහිත වේ.
(5) එක් පුද්ගලයෙක් හෝ කිහිප දෙනෙක් විසින් ආරම්භ කොට පවත්වාගෙන යයි.

7.දැනුම් සමාජය පිළිබඳ සාවද්‍ය අදහසකි.
(1) දැනුම කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරීත්වයක් සහිත වූවකි.
(2) ලෝකයේ වටිනාම භාණ්ඩය තොරතුරු ලෙස හඳුනා ගත්තකි.
(3) මානව ඉතිහාසයේ නව යුගයක් නියෝජනය කරන්නකි.
(4) පෙරදිග මතවාදයට සමගාමීව ගොඩනැගුණකි.
(5) විවිධ ජීවන ශෛලීන් හා චින්තන මාදිලීන් ප්‍රදර්ශනය කරන්නකි.

8. සමාජ විකාශනයට සමගාමීව මාධ්‍ය තාක්ෂණයේ සංවර්ධණය පිළිබඳව විද්වතෙකු විසින් සිය දේශනයේදී පහත සඳහන් නම් ඉදිරිපත් කරන ලදි.

A- සායි ලූං B- ගුග්ලිමෝ මාර්කෝනි C- ජොහැන්නස් ගුටෙන්බර්ග් D- ආතර් සී. ක්ලාක්
සන්නිවේදන විකාශනයට අනුව මෙහි අනුපිළිවෙල විය යුත්තේ

1. ABDC 2. ACBD 3. DCBA 4. ADCB 5. BACD

9. ජනසන්නිවේදන ක්‍රියාවලියට අනුව සාවද්‍ය ප්‍රකාශයකි,
1. ජන සංහතියක් ඉලක්ක කර ගනී.
2. ජනමාධ්‍යවේදියා විසින් පෙළ සම්පාදනය කරයි.
3. මාධ්‍ය සාක්‍ෂරතාව අත්‍යවශ්‍ය වූවකි.
4. පුහුණු ජනමාධ්‍යකරුවන් අවශ්‍ය වේ.
5. ලෝකයම ආවරණය කරන විට විශ්ව සන්නිවේදනය බිහි වේ.

10. තම ආයතනයේ සේවයෙ නියුතු සේවක මණ්ඩලය විනෝද චාරිකාවක් රැගෙන යාමට කටයුතු කරන ලදි. මහජන සම්බන්ධතා ක්‍රියාවලියට අදාළව මෙම කටයුත්ත අයත් වන්නේ
1.අනුග්‍රාහකත්වයක් වශයෙනි.
2.ආයතනයේ ප්‍රචාරයට සහාය ලබා ගැනීමක් වශයෙනි.
3.අභ්‍යන්තර මහජන සම්බන්ධතා කටයුත්තක් වශයෙනි.
4.විනෝදය ලබාගැනීමට අවස්ථාව සැලසීමක් වශයෙනි.
5.තරඟකාරී ආයතනවල සේවකයින් දිරිගැන්වීමක් වශයෙනි.

11. නගරයට රැස් වූ පිරිසක් සීඝ්‍රයෙන් ඉහළ යන බඩු මිල පහත හෙළනු යනුවෙන් විරෝධතා ව්‍යාපාරයක් පවත්වයි. එම කණ්ඩායම අයත් වනුයේ,
1.අහඹු කණ්ඩායමට ය.
2.ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායමට ය.
3.විශෝධන කණ්ඩායමට ය.
4.අවිධිමත් කණ්ඩායමට ය.
5.ඉගෙනුම් කණ්ඩායමට ය.

12. ඉතා දුරස්ථව සිටින දෙදෙනෙකු අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදෙන විට ඔවුන්ට යම් කිසි යන්ත්‍රයක සහාය පැතිය යුතු වේ. එවන් යන්ත්‍ර වර්ග අයත් වන්නේ,
1.ෆැක්ස් යන්ත්‍රය, අන්තර් ජාල විද්‍යුත් තැපෑල, දුරකථනය
2.දුරකථනය, රූපවාහිනිය, ෆැක්ස් යන්ත්‍රය
3.අන්තර්ජාල වෙබ් අඩවි, දුරකථනය, ෆැක්ස් යන්ත්‍රය
4.අන්තර්ජාලය, ගුවන්විදුලිය, දුරකථනය
5.ජංගම දුරකථනය, රූපවාහිනිය, ෆැක්ස් යන්ත්‍රය

13. සමාජයක පුරවැසි මාධ්‍ය භාවිතය උත්සන්න වීමට මූලික වශයෙන් බලපාන්නේ
(1) අධිපතිවාදී මාධ්‍ය ප්‍රවණතා තීව්‍ර වීම ය.
(2) නිදහස් මාධ්‍ය ප්‍රවණතා පැතිරයෑම ය.
(3) සංවර්ධනාභිමුඛ මාධ්‍ය භාවිතය වර්ධනය වීම ය.
(4) ජන මාධ්‍ය ව්‍යාප්ත වීම ය.
(5) මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය වීම ය.

14. සමකාලීන ගෝලීයකරණයේ මුඛ්‍ය ලක්ෂණයක් නොවන්නේ,
(1) සංස්කෘතික සුරක්ෂිතතාවයි.
(2) තරගකාරීත්වයයි.
(3) නිර්බාධ වෙළඳාමයි.
(4) පෞද්ගලික ව්‍යවසායයි.
(5) ජාතික රාජ්‍ය දුර්වල වීමයි.

15. පාසල් සිසුවියක වන රුමේෂිගේ මාධ්‍ය භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ඇය තම සමීප මිතුරන් සමඟ පමණක් මාධ්‍ය පිළිබඳ අදහස් හුවමාරු කර ගනී.
B - ඇයට ජනමාධ්‍ය අන්තර්ගතය පිළිබඳ ඉහළ දැනුමක් ඇත.
C - ඇය ජනමාධ්‍ය ආයතනවලට සෘජුව කරුණු ඉදිරිපත් කරයි.
D - ඇයට ජනමාධ්‍ය පිළිබඳ විමර්ශනාත්මක දැක්මක් තිබේ.

සක්‍රීය ග්‍රාහකයෙකු වන රුමේෂි පිළිබඳ ඉදිරිපත්ව ඇති ප්‍රකාශ අතරින්,

(1) B හා C සත්‍ය වේ. (2) A B හා D සත්‍ය වේ. (3) B C හා D සත්‍ය වේ. (4) A B හා D සත්‍ය වේ.
(5) සියල්ල සත්‍ය වේ.

16. සංකේත යනු
(1) බොහෝ දෙනා තුළ එකම අර්ථය ජනනය කරන්නකි.
(2) වෙනත් යමක් නියෝජනය කරන දෙයකි.
(3) නිර්වාචික සන්නිවේදනයට අදාළ වූවකි.
(4) පුද්ගලයන් නොව අදහස් නියෝජනය කරන්නකි.
(5) කථන සන්නිවේදනයට පරිබාහිර දෙයකි.

17. සන්නිවේදනය රේඛීය ලෙස ක්‍රියාත්මක වන්නේ
(1) සන්නිවේදකයා, මාධ්‍ය බලපෑම හා ග්‍රාහකයා තුළිනි.
(2) මූලාශ්‍රය, නාලිය, ආකේතකරණය හා ප්‍රතිචාරය මගිනි.
(3) සන්නිවේදකයා, බාධක, ප්‍රතිපෝෂණය හා බලපෑම මගිනි.
(4) සන්නිවේදකයා, ග්‍රාහකයා, මූලාශ්‍රය හා මාධ්‍ය තුළිනි.
(5) සන්නිවේදකයා, සංදේශය, මාධ්‍ය හා ග්‍රාහකයා තුළිනි.

18. ජනමාධ්‍ය මගින් සිදුවන සන්නිවේදනයේදී අනිවාර්ය සාධකයක් නොවන්නේ
(1) දොරටුපාල කාර්යය යි.
(2) තාක්ෂණික විධික්‍රම භාවිතය යි.
(3) ද්විමාර්ගික බවකින් යුක්ත වීමයි.
(4) පොදු සංදේශ විසරණය යි.
(5) ධූරාවලියක් සහිත ආයතනික රටාවයි.

19. ජනමාධ්‍යකරුවන් හා පාලන තන්ත්‍රය සහයෝගයෙන් කටයුතු කරනු හැමවිටම දක්නට ලැබෙන්නේ කවර සන්නිවේදන සංකල්පයේදී ද?
(1) සමාජ වගකීම්
(2) ප්‍රජාතන්ත්‍රවාදී
(3) නිදහස් මතවාදී
(4) අධිපතිවාදී
(5) සෝවියට් කොමියුනිස්ට්

20. සන්නිවේදන ක්‍රියාවලියේදී දොරටුපාල සංකල්පය ක්‍රියාත්මක වීමට බලපාන සාධකය නොවන්නේ
(1) මාධ්‍ය හිරකාරීත්වය යි.
(2) මාධ්‍ය අනුග්‍රාහකත්වය යි.
(3) මාධ්‍ය නියාමනය යි.
(4) මාධ්‍ය නිදහස යි.
(5) මාධ්‍ය සංස්කෘතිය යි.

21. සන්නිවේදනය සඳහා බලපාන 'සන්දර්භය' යන සාධකයෙන් මූලික ව අදහස් වන්නේ,
(1) සන්නිවේදන අරමුණයි. (2) සන්නිවේදන චර්යාවයි. (3) සන්නිවේදන වටපිටාවයි.
(4) සන්නිවේදන නාලිකාවයි. (5) සන්නිවේදන කුසලතාවයි.

22. සන්නිවේදනය සඳහා අවශ්‍යය ම කොන්දේසිය වන්නේ
(1) දෙදෙනෙකු සිටීම යි.
(2) ප්‍රකාශ කිරීමට අදහස් තිබීම යි.
(3) සංඥා පද්ධතිය තිබීම යි.
(4) යම් සිදුවීමක් පැවැතීම යි.
(5) තොරතුරු පැවැතීම යි.

23. 'පොළොව මත ගෙවුණු ඉතා දිගු ඉතිහාසය එක් දිනක් ලෙස කල්පනා කළ හොත් සන්නිවේදනයේ පැවැත්ම ඇති වූයේ ඊයේ මැදියම් රැයට නිමේෂයකට පෙරදී බව කිව හැකි ය' යැයි ප්‍රකාශ කරන ලද්දේ

(1) හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.
(2) විමල් දිසානායක ය.
(3) එඩ්වර්ඩ් සැපීර් ය.
(4) මාෂල් මැක්ලූහාන් ය.
(5) විල්බර් ශ්‍රාම් ය.

24. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න
(1) කථන සන්නිවෙව්දනය තුළ වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකිය.
(2) ලිඛිත සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකිය.
(3) කථන සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකිය.
(4) ලිඛිත සන්නිවේදනය තුළ වාචික සන්නිවේදන විධි ඇතුළත්ව තිබිය හැකිය.
(5) ලිඛිත සන්නිවේදනය තුළ කථන සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකිය.

25. පුවත්පත් හා පාඨකයා අතර පවත්නා සබඳතාවට වඩා පුවත්පත් හා රජය සමග පවත්නා සබඳතාව වඩාත් ම ප්‍රකට වන්නේ
(1) ලිබරල්වාදී සංකල්පයේදී ය ය.
(2) සමාජ වගකීම් සංකල්පයේදී ය.
(3) අධිපතිවාදී සංකල්පයේදී ය.
(4) කොමියුනිස්ට්වාදී සංකල්පයේදී ය.
(5) ප්‍රජාතාන්ත්‍රික සංකල්පයේදී ය.

26. ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරක වෙත ලැබුණු ප්‍රවෘත්ති වාර්තාවල ඇතුළත් වූ වැකි කිහිපයක් පහතින් දැක්වෙයි. එහි සඳහන් නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) උපාධි ප්‍රධානෝත්සවය පසුගිය දා පැවැත් විණි.
(2) ඝාතනය පිලිබඳ ඔවුන් මෙසේ කීවේ ය.
(3) සමහරු ප්‍රතිවිරුද්ද අදහස් දැක් වී ය.
(4) නිවැරදිකරුවන් කවුදැයි ප්‍රකාස කල නො හැක.
(5) කෙනෙක් නිශ්ශබ්දව සිටිය හ.

27. භාෂාවේ සම්භවය පිළිබඳ මතයක් නොවන්නේ,
1) පරිණාමවාදී මතයයි
2) අංග වික්ෂේප න්‍යායයි
3) හස්ථ විපර්යාස මතයයි
4) විකාශනවාදී මතයයි
5) මුඛ වික්ෂේප න්‍යායයි

28. මාධ්‍ය මගින් සිදුකරන සමාජානුයෝජනය
A- සමාජ පාලන ක්‍රියාවලියක් ලෙස බොහෝ විට සැලකේ
B- සමාජයේ සාමාජිකයින්ට සිය භූමිකාව කවරේද යන්න පැහැදිලි කරයි.
C- විවිධ සමාජ ක්‍රියාකාරකම් සිදුවන ආකාරය විවරණය කරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන්

1) A හා B සත්‍ය වේ. 2) A හා C සත්‍ය වේ. 3) B හා C සත්‍ය වේ.
4) A, B හා C යන සියල්ල සත්‍ය වේ. 5) A,B හා C යන සියල්ල අසත්‍ය වේ.

29. පහත සඳහන් ප්‍රකාශවලින් නිරූපණය වන භාෂා ප්‍රභේද නියෝජනය වන අනුපිළිවෙල සඳහන් පිළිතුර දක්වන්න.

A- රිද්මය, වේගය, යෙදුම් ආදියෙහි සුවිශේෂතා ඇතිවීම

B- පෞද්ගලික දෘෂ්ටියක් මෙන්ම මතවාදයක් අවශ්‍ය වීම

C- විරාම, යෙදුම් නියමිත සම්ප්‍රදායන් භාවිත වීම

1) ලේඛනය, රූපණය, කථනය
2) කථනය, විවරණය, ලේඛනය
3) රූපණය, කථනය, ලේඛනය
4) ලේඛනය, විවරණය, කථනය
5) විවරණය, ලේඛනය, රූපණය

30. සමාජයක අධෝ ව්‍යුහයේ ස්වභාවය නිර්ණය කරන අංශ දෙක වන්නේ,

1) ව්‍යවසාය මූල අංශය හා කාර්මික අංශයයි.
2) ප්‍රජාමූල අංශය හා ව්‍යවසාය මූල අංශයයි.
3) කාර්මික අංශය හා ප්‍රජාමූල අංශයයි.
4) සේවා අංශය හා කාර්මික අංශයයි.
5) ආර්ථික අංශය හා දේශපාලන අංශයයි.

31. ජනමාධ්‍ය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A- ලාභ පරමාර්ථය මුල් කර ගනී.

B- ග්‍රාහක කණ්ඩායම කුඩා වේ.

C- පුළුල් බෙදාහැරීමේ ජාලයකින් යුක්ත වේ.

D- සුළුතරයේ මත නියෝජනය වේ.

E- සමාජ වෙනසක් වෙනුවෙන් පෙනී සිටී.

ඉහත දැක්වෙන අදහස් අතුරෙන් විකල්ප ජනමාධ්‍යයක ලක්ෂණ හා ගැළපෙන්නේ,

1) A,Bහා C පමණි.
2) A,B හා D පමණි.
3) B,C හාE පමණි.
4) B,D හා E පමණි.
5) A,B,C,Dහා E යන සියල්ලම ය.

32. සමාජ විෂමතාව උපරිම කිරීමෙහිලා වඩාත් අනුබල දෙන සංස්කෘතික ප්‍රභේදය වන්නේ

(1) ජන සංස්කෘතියයි.
(2) බහුජන මාධ්‍ය සංස්කෘතිය යි.
(3) සම්භාව්‍ය සංස්කෘතිය යි.
(4) වාර්ගික සංස්කෘතිය යි.
(5) සාම්ප්‍රදායික සංස්කෘතිය යි.

33. ජනසන්නිවේදන ක්‍රියාකාරීත්වය මත නිර්මාණය වන සංස්කෘතිය වන්නේ,

(1) වාර්ගික සංස්කෘතියයි.
(2) සංහතික සංස්කෘතියයි.
(3) ගැමි සංස්කෘතියයි.
(4) ජන සංස්කෘතියයි.
(5) ජාතික සංස්කෘතියයි.

34. සන්නිවේදන ක්‍රියාවලියේදී තොරතුරු ආකේතකරණය ලක් කිරීම පිළිබඳව ප්‍රථම වරට පෙන්වා දෙන ලද්දේ

(1) විල්බර් ශ්‍රාම් ආකෘතිය යි.
(2) ඩේවඩ් කේ. බර්ලෝ ආකෘතිය යි.
(3) හැරල ඩී. ලැස්වෙල් ආකෘතිය යි.
(4) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් ආකෘතිය යි.
(5) ශ්‍රැම්-ඔස්ගුඩ් ආකෘතිය යි.

35. ගෘහස්ථ සාමය හා සහජීවනය කළමනාකරණය කර ගැනීමේ දී නොකළ යුතු කාර්යයක් වනුයේ,
   1. වෙනත් ගෘහවල සාමාජිකයන් සමග සසඳමින් තම ගෘහයේ සාමාජිකයන්ගේ අඩුපාඩු දැනගැනීම
   2. ස්වභාවික පරිසරයට ආදරය කිරීමේ සංස්කෘතියක් ගෘහය තුළ නොඩනැංවීම
   3. එකිනෙකාගේ අඩුපාඩු හුවා නොදැක්වීම
   4. අවමාන, සමච්චල් ගෘහය තුළ නොපැවතීම
   5. යහපත් චර්යාවක් අගය කිරීම

36. ගුවන්විදුලි මාධ්‍ය භාවිතයේදී පහත ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කළ යුතු බව නිමල් පන්තියේදී ප්‍රකාශ කළේය.

A – ක්ෂණභංගුර මාධ්‍යයක් වීම
B – කථන රූපී භාෂා රටාව
C – රූපණ කාර්යය සහිත වීම
D – ග්‍රාහක කේන්ද්‍රීය ශිල්පක්‍රම භාවිතය

මෙයින් සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි. (4) A, B හා C පමණි. (5) A, B, C හා D ය.

37. බාහිර උපකරණ භාවිතය අත්‍යවශ්‍ය වන සන්නිවේදන වර්ගය වන්නේ

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය යි.
(2) අන්තර්වර්තී සන්නිවේදනය යි.
(3) සමූහ සන්නිවේදනය යි.
(4) වාචික සන්නිවේදනය යි.
(5) ජනසන්නිවේදනය යි.

38. සංවර්ධන සංදේශ නිර්මාණයේ දී ප්‍රමුඛ අවධානය යොමු විය යුත්තේ,
   1) යොදා ගන්නා මාධ්‍ය තෝරා ගැනීම පිළිබඳව ය.
   2) ග්‍රාහකයා තුළ සුබවාදී ආකල්පමය වෙනසක් ඇති කිරීම පිළිබඳව ය.
   3) ග්‍රාහක කණ්ඩායම ආකර්ෂණය කර ගැනීම පිළිබඳව ය.
   4) සංදේශ නිර්මාණයට ගතවන කාලය හා වැයවන ශ්‍රමය පිළිබඳව ය.
   5) විවිධාකාරයෙන් නිර්මාණශීලීව සන්දේශ සකස් කිරීම පිළිබඳව ය.

39. සංස්කෘතික මූලිකාංග යටතට ගැනෙනුයේ

A- උප සංස්කෘතිය
B- විරෝධී සංස්කෘතිය
C- ජන සංස්කෘතිය
D- සංස්කෘතික කම්පනය
E- මාධ්‍ය සංස්කෘතිය

1. A හා B පමණි. 2. A,B හා D පමණි. 3. A,C හා E පමණි. 4. C,D හා E පමණි. 5. B හා D පමණි.

40. පහත පියවර අතුරින් තීරණ ගැනීමේ නිවැරදි පියවර පිළිවෙලින් දැක්වෙන්නේ,

A- ගැටළුවේ ස්වභාවය විශ්ලේෂණය
B- ගැටලුවක් ඇති බව හඳුනා ගැනීම
C- විකල්ප තීරණ කීපයක් ගොඩනංවා ගැනීම
D- වඩාත් යෝග්‍ය තීරණ ගැනීම
E- තීරණ ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව මැන බැලීම

1. ABCDE 2. BDEAE 3. BACDE 4. CDAEB 5. DECAB

41. මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. මාධ්‍ය සංස්තිය නිර්මාණය කිරීමේ උපාය මාර්ග සැලසුම්කරණය කරනුයේ බටහිර රටවල්ය.
   2. මාධ්‍ය සංස්කෘතික සංසරණයේදී හොඳින් හුවමාරුවීම් සිදු වේ.
   3. මාධ්‍ය සංස්කෘතිය බිහිවීමට දැඩි මාධ්‍ය බලපෑම හේතු වේ.
   4. මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය හා සංසරණය සැලසුම් කරන ලද ක්‍රියාවලියකි.
   5. මාධ්‍ය සංස්කෘතිය සංසරණය ඒක මාර්ගික වේ.

42. උපභාෂාවක් පිළිබඳව කියැවෙන සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. උපභාෂාවක් යනු ප්‍රධාන භාෂා ධාරාවෙන් බිඳී ආ අනු ධාරාවකි.
    2. උපභාෂාවක් අයත් වන්නේ ඊට ආවේණික උප සංස්කෘතියකට ය.
    3. උපභාෂාවක් මගින් ජනමාධ්‍යවල පණිවිඩ වඩාත් අර්ථවත් කරයි.
    4. උපභාෂාවක් තුළ යම් සමාජ සංස්කෘතික පරිසරයක් නිරූපණය කරයි.
    5. උපභාෂාවක් බිහිවීම මානව සමාජයේ ස්වභාවික අවශ්‍යතාවයකි.

43. අතීතයේ ශ්‍රී ලංකාවේ සිටි ඇතැම් රජවරු වෙස්වලා ගනිමින් ගම් දනව් වල සැරි සැරූ බව කියැවේ. මෙහි මූලික පරමාර්ථය වන්නේ
    1. තමාගේ විරුද්ධවාදීන් කවුරුන් දැයි දැන හඳුනා ගැනීම
    2. තම විනෝදාංශයක් ලෙස එය කිරීම
    3. මනා මහජන සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට
    4. මහජන කීර්තිනාමය අත්පත් කර ගැනීම
    5. මහජන මතය සොයා බැලීම

44. ජනවිශ්වාස, ශාන්තිකර්ම, අලිමන්තර ආදිය
    1. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානයයි.
    2. සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයි.
    3. මිනිස් විශ්වාසයයි.
    4. දේශීය සංස්කෘතියයි.
    5. මිත්‍යා විශ්වාසයි.

45. චීන සංවර්ධන සන්නිවේදන ආකෘතියේ අරමුණක් නොවන්නේ
    1. ජාතික සංවර්ධනයට අදාළ සැලැස්ම ක්‍රියාවට නැංවීම
    2. පොදු සාමූහික විඥානයක් ගොඩනැංවීම
    3. ජාතික සංවර්ධන ප්‍රතිපත්ති පුද්ගලයා වෙත ගෙන යාම
    4. ජනතාව හා රජය අතර සබඳතා වර්ධනය කිරීම
    5. බහුජන මාධ්‍ය යොදා ගැනීමේ සුවිශේෂීතාව

46. ආචාරශීලීත්වය පිළිබඳ ඉදිරිපත් වූ අදහස් කීපයක් මතු දැක් වේ.
    A- ආචාරශීලීත්වය ප්‍රදර්ශනය වන හා දැනෙන දෙයකි.
    B- ආචාරශීලීත්වය සෑම ජන සමාජයකම එකම ස්වභාවයෙන් යුක්ත ය.
    C- කථනය, අවාචික ඉරියව් හා හැසිරීම් මගින් ආචාරශීලීත්වය ප්‍රදර්ශනය කළ හැකි ය.
    D- සමාජයේ අඛණ්ඩ හා ස්ථිරසාර පැවැත්මට ආචාරශීලීත්වය අවශ්‍ය වේ.

    මේවා අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ

1. A,B හා C පමණි.
2. A හා C පමණි.
3. C හා D පමණි.
4. A,C හා D පමණි.
5. A,B,C හා D

47. මහවැලි ව්‍යාපාරය යටතේ මෙරට ක්‍රියාත්මක වූ ප්‍රජා ගුවන්විදුලි සේවා පමණක් අඩංගු කාණ්ඩය කුමක්ද?
    (1) ගිරාඳුරුකෝට්ටේ, මහඉලුප්පල්ලම සහ ඌව
    (2) මහවැලි, ඌව සහ රුහුණු
    (3) ගිරාඳුරුකෝට්ටේ, රජරට සහ කොත්මලේ
    (4) මහවැලි, පුලතිසිරාවය සහ රජරට
    (5) මහඉලුප්පල්ලම, පුලතිසිරාවය සහ කොත්මලේ

වසන්ත ඇල්ලවල

48. සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ භූමිකා හුවමාරුව වඩාත් විවරණය කරන ලද සන්නිවේදන ආකෘතිය වන්නේ

(1) විල්බර් ශ්‍රාම් ආකෘතිය යි.
(2) ඩේවඩ් කේ. බර්ලෝ ආකෘතිය යි.
(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය යි.
(4) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් ආකෘතිය යි.
(5) ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතිය යි.

49. මාධ්‍ය විචාරය පිළිබඳව ඉදිරිපත් වූ අදහස් කීපයක් පහත දැක්වේ.

A- මාධ්‍ය විචාරයේ දී එම මාධ්‍ය නිර්මාණයේ හැඩරුව නැවත විනිශ්චයකට ලක් කළ හැකි ය.
B- මාධ්‍ය විචාරය සඳහා නිර්මාණකරුවාට ද දායක විය හැකි ය.
C- මාධ්‍ය නිර්මාණ සමාජය මත තබා මැන බැලීමක් විචාරයේ දී සිදු වේ.
D- මාධ්‍ය විචාරය ග්‍රාහක සංජානන ශක්තිය ඉහළ නංවනු ලබයි.
E- මාධ්‍ය විචාරය නිර්මාණකරුවන්ගේ දෘෂ්ටිය පෘථුල කර ගැනීමට හේතු වේ.

මෙම ප්‍රකාශ අතරින් නිවැරදි අදහස් වන්නේ

1. A,B, C හා E පමණි.

2. A,C, D හා E පමණි.

3. A,B,C හා E පමණි.

4. A,B, C හා D පමණි.

5. A,B,C,D හා E යන සියල්ල

50. මාධ්‍ය සමීක්ෂණ යොදා ගනු ලබන්නේ

A - ග්‍රාහක රුචි අරුචිකම් දැන ගැනීමටය
B - ග්‍රාහක ක්ෂේත්‍රයේ සංයුතිය හඳුනාගැනීමටය
C - ග්‍රාහක අවශ්‍යතා අනුව මාධ්‍ය නවීකරණයටය
D - නාලිකාවේ ව්‍යාප්තිය විමර්ශනය කිරීමටයි

ඉහත ප්‍රකාශ අතුරෙන්

(i) A පමණක් සත්‍ය වේ
(ii) A සහ C පමණක් සත්‍ය වේ
(iii) A සහ B පමණක් සත්‍ය වේ
(iv) A B හා C පමණක් සත්‍ය වේ
(v) A B C හා D යන සියල්ල ම සත්‍ය වේ